(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 140.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 මාර්තු 20 සිකුරාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

24/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේ සිට මේ දක්වා විදේශ රැකියාවල නිරතව සිටියදී විවිධ පීඩාවන්ට පත්වී ඇති ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන් අතරින් මේ වනවිට වන්දි ලබාදී ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) මෙලෙස පීඩාවන්ට පත්වන ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයන්ට ලබා දෙන ලද වන්දි මුදල වැඩි කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

121/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අටවැනි විධායක ජනාධිපතිවරයාගේ ධුර කාලය තුළ ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහන සංචිතයේ තිබූ නිල වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන සංචිතයෙන් වෙනත් රාජ්‍ය ආයතන වෙත වාහන අනුයුක්ත කර තිබුණේද;

(iii) එසේ නම්, එම වාහන සංඛ්‍යාව කොපමණද;

(iv) 2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවති ජනාධිපතිවරණයෙන් පසු එම වාහන අතරින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත නැවත භාරදුන් වාහන සංඛ්‍යාව කොපමණද;

(v) භාරදුන් වාහන නැවත භාවිතයට ගෙන තිබේද;

(vi) නොඑසේ නම්, එම වාහන සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහන සංචිතයේ ඇති නිල වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල වාහන භාවිතය සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තිය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

208/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ලැක්මියුලෙස්' එන්නත් මිලට ගැනීමේදී වෛද්‍ය සැපයීම් අංශයේ සිදුවී ඇති වංචාව සම්බන්ධයෙන් දැනුම්වත්වී තිබේද;

(ii) එම වංචාව සම්බන්ධයෙන් චෝදනා එල්ලවූ නිලධාරින්ගේ නම් හා තනතුරු නාම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම වංචාව සම්බන්ධව සිදු කරනු ලබන පරීක්ෂණවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

231/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙක් යටතේ නීතිපති දෙපාර්තමේන්තුවේ පළාත්බද කාර්යාල ස්ථාපිත කිරීමට 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් පොරොන්දුවී තිබේද;

(ii) එසේ නම්, මේ වනවිට එක් එක් පළාතේ පළාත්බද නීතිපති දෙපාර්තමේන්තු කාර්යාල සඳහා අනුයුක්ත කර ඇති සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නීතිපති දෙපාර්තමේන්තුවේ පළාත්බද කාර්යාල ස්ථාපිත කිරීම සඳහා මේ වනවිට ආයෝජනය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

356/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ පැවති යහපාලන රජයේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් මඩකලපුව, මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වවුනතිවු හි නිවාස 50කට අධික සංඛ්‍යාවක් ඉදිකරන ලද බවත්;

(ii) ඒ අතරින් බොහෝමයක් නිවාසවල වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් නොකර අඩුපාඩු සහිතව පවතින බවත්;

(iii) ඊට පසුව බලයට පත්වූ රජයන් විසින් එම නිවාසවල වැඩ කටයුතු අවසන් නොකළ බවත්;

(iv) ඒ හේතුවෙන් මේ වනවිට වර්ෂ 8කට වැඩි කාලයක් එම ජනතාව විවිධ දුෂ්කරතාවයන්ට මුහුණදී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඉහත නිවාසවල වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඉහත නිවාසවල වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට අපේක්ෂිත කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

465/2025

ගරු රවී කරුණානායක මහතා,— වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වනවිට ශ්‍රී ලංකාවේ සීනි, කිරිපිටි, පරිප්පු, සහල්, තිරිඟු පිටි සහ පොල්වල මුළු පරිභෝජනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2010 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේ ඉහත අයිතමවල පරිභෝජනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i) සහ (ii) අනුව ඒක පුද්ගල පරිභෝජනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (i)හි සඳහන් එක් එක් අයිතමයෙන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද ප්‍රමාණය සහ ආනයනය කරන ලද ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත (i)හි සඳහන් එක් එක් අයිතමයේ ආනයන වටිනාකම ඇමරිකානු ඩොලර් සහ ශ්‍රී ලංකා රුපියල් වලින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) ඉහත (i)හි සඳහන් එක් එක් අයිතමයෙන් අය කරන ලද ආනයන බදු ප්‍රමාණය කවරේද;

(vii) ඉහත (i)හි සඳහන් එක් එක් අයිතමයේ තීරු බදු ඇතුළුව මිල කවරේද;

(viii) ඉහත සඳහන් එක් එක් අයිතමයේ නිෂ්පාදන පිරිවැය සහ සිල්ලර මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ix) ශ්‍රී ලංකාවේ ඉහත අයිතමවල නිෂ්පාදන පිරිවැය අතර සැලකිය යුතු වෙනසක් ඇතිවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

553/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා විමුක්ති පෙරමුණේ ආරම්භක නායක රෝහණ විජේවීර මහතාගේ බිරිඳගේ සහ දරුවන්ගේ නම් කවරේද;

(ii) රෝහණ විජේවීර මහතාගේ ඝාතනයෙන් පසු මේ දක්වා ඔවුන් ජීවත්වූ එක් එක් ස්ථානය සහ එම එක් එක් ස්ථානයේ ජීවත්වූ කාල සීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන්ගේ නඩත්තු වියදම් ශ්‍රී ලංකාවේ රජය විසින් දරා තිබේ නම්, ඒ සඳහා දරන ලද වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඔවුන්ගේ නඩත්තු කටයුතු වෙනත් පුද්ගලයෙක් හෝ පුද්ගල කණ්ඩායමක් විසින් දරා තිබේ නම්, නඩත්තු කරන ලද කාල සීමාව සහ ඒ සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඔවුන්ගේ නඩත්තු කටයුතු සඳහා විදේශ රටවලින් ආධාර ලැබී තිබේද;

(vi) එසේ නම්, ආධාර ලබා දුන් රට, පුද්ගලයන් සහ ආධාර ලබා දුන් කාල සීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

566/2025

ගරු රෝහණ බංඩාර මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී 'ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතිය' නමින් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ස්ථාපිත කර ඇති ගබඩා සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලැබූ ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(v) එම ව්‍යාපෘතිය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

640/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.01.01 දින සිට මේ දක්වා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සහල් සම්බන්ධයෙන් සිදු කරන ලද වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැටලීම්වලදී අයකර ගන්නා ලද දඩ මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) සහල් සම්බන්ධයෙන් සිදු කරනු ලබන වැටලීම් තවදුරටත් වැඩි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1311/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2022 සිට 2024 දක්වා ව්‍යාපාරික කටයුතුවලට, සංචාරය සඳහා හෝ වෙනත් කටයුතු සඳහා මාලදිවයිනට ගිය ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව සහ ශ්‍රී ලංකාවට පැමිණි මාලදිවයින් ජාතිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මාලදිවයිනේ සංචාරය කරනු ලබන ශ්‍රී ලාංකිකයන් සඳහා 'පැමිණි විගස වීසා' (Visa on arrival) ලබා දීමෙන් ශ්‍රී ලංකාවට අත්වූ ප්‍රතිලාභය කවරේද;

(iii) දින අනුවක නිදහස් වීසා පහසුකම් ලබා දෙන ලද්දේ මාලදිවයිනට යන ශ්‍රී ලාංකිකයන් සඳහා පමණක්ද;

(iv) නොඑසේ නම්, ශ්‍රී ලංකාවට පැමිණෙන මාලදිවයින් ජාතිකයන්ටත් එම පහසුකම් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 2026 පෙබරවාරි 20 දින පාර්ලිමේන්තුවට පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ සඳහන් මතු දැක්වෙන තත් කාරක සභා නිර්දේශ පිළිගත යුතු ය:—

**දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) හි පළමුවැනි ඡේදයට ඉක්බිතිව ම මතු සඳහන් නව ඡේදය ඇතුළත් කිරීම:—**

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතල මූල්‍ය වංචා, අල්ලස් හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ පසු පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, එකී සිද්ධීන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් ඍජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය.

**දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) හි පළමුවැනි ඡේදයට ඉක්බිතිව ම මතු සඳහන් නව ඡේදය ඇතුළත් කිරීම:—**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතල මූල්‍ය වංචා, අල්ලස් හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ පසු පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, එකී සිද්ධීන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් ඍජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය.

*2.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා,— ලංකා ධීවර සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2018),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තිය යටතේ 2025.02.14 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ධීවර සංස්ථාවේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.09.09 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.09.11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*4.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*7.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

8.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

9.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (අවලංගු කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---